# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013.08.27

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති හා වැඩබලන ගරු සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති හා වැඩබලන ගරු සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 7. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් පෞද්ගලික සංචාරයක් සඳහා විදේශගතව සිටින බැවින් මෙදින මහා සභා රැස්වීමට සහභාගී නොවූ අතර ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා අසනීප තත්තවය හේතුවෙන් මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා තිබුණි.

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු වැඩබලන සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එය කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු වැඩබලන සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළුම දෙනා ඉතාමත් සාදරයෙන් පිළිගන්නා බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දන්වන ලදී.

පසුගිය සභා වාරයේ දී තමන් නගර සභාවේ මහා සභා රැස්වීමක පළමු වරට මූලාසනය දරමින් කටයුතු කළ අතර, එම රැස්වීම පැය 1.30ක පමණ කාලයක් තුළ අවසන් කිරීමට හැකි වූ බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී. එය තම ජීවිතයේ වැදගත් සිදුවීමක් බවත්, ඒ සඳහා සහයෝගය දැක්වීම සම්බන්ධව සියළුම දෙනාට ස්තුතිය පළ කරන බවත්, එතුමන් විසින් සඳහන් කරන ලදී.

මෙම නගර සභාවෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවක් සඳහා මුදල් වෙන් කිරීමේ සාකච්ඡාවකට පසුගිය 19 වන දින වැඩ අධිකාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන මහත්වරුන් සමගින් තමන් ද සහභාගී වූ බව ද, එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 37ක් පමණ පැමිණ සිටි බව ද, ඒ පැමිණ සිටි සියළුම පළාත් පාලන ආයතනයන් අතර බළන්ගොඩ නගර සභාවට කැපී පෙනෙන ස්ථානයක් ලැබූ බව ද, කිසිදු කපාහැරීමකින් තොරව අදාල මුදල් ප්‍රතිපාදන මෙම සභාව වෙත ලබා දීමට එම රැස්වීමේ දී තීරණය වූ බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එම වැඩසටහනේ දී තමන් මෙම සභාවේ වැඩ බලන සභාපතිවරයා වශයෙන් ගරු සභාපතිතුමන්ගේ වැඩපිළිවෙල ප්‍රශංසාවට ලක් කිරීම පැමිණ සිටි අනෙකුත් ගරු සභාපතිතුමන්ලාගේ ඇගැයීමට ලක් වූ බව ද ගරු වැඩබලන සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

කිසිදු කපා හැරීමකින් තොරව සම්පූර්ණ මුදල ලබා ගැනීමට හැකි වීම සම්බන්ධව සහ ගරු සභාපතිතුමන් නොමැති අවස්ථාවක තමන් වෙත පැවරුණු වගකීම මැනැවින් ඉටු කිරීමමට හැකිවීම පිළිබඳව සතුටට පත් වන බව ද එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අද දින රාත්‍රී ගරු සභාපතිතුමන් ශ්‍රී ලංකාවට පැමිණෙන බවත්, කාර්යාලයේ දී එතුමන් පිළිගැනීමට උත්සවයක් සංවිධානය කර ඇති බවත්, තමන් විසින් සකස් කරන ලද මෙම සභාවේ ආරම්භයේ සිට කටයුතු කළ ගරු උප සභාපතිතුමන්ලාගේ ලේඛනය ද එදිනට විවෘත කිරීමට බලාපොරොත්තු වන බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 බස්නැවතුම්පොල 10 සී කඩ කාමරය පවරා දීම - ටී. එම්. වී. බණ්ඩාර මයා

දැනට බස්නැවතුම්පොල අංක 10 සී කඩකාමරය පවත්වාගෙන යනු ලබන තමන්ගේ වන කේ. ජී. ඩී. සමන්කුමාර යන අයට එම කඩකාමරය පවත්වාගෙන යාමට අපහසු වන බැවින්, එම කඩ කාමරය තමන් වෙත පවරා දෙන මෙන් ටී. එම්. වී. බණ්ඩාර යන අය විසින් මහා ඉල්ලීමක් කර ඇති බව ද, දැනට එම කඩ කාමරයේ නීත්‍යානුකූල බදුකරු වශයෙන් කේ. ජී. ඩී. සමන්කුමාර යන අය ලේඛනගතව ඇති බව ද, අදාල කඩකාමරය ටෙන්ඩර් ක්‍රමයට ලබා දී ඇති බැවින් එය වෙනත් අයකුට පැවරීමේ දී චක්‍රලේඛනයේ ප්‍රකාරව කීමනි මුදලින් 25%ක් අය කර එම අය වෙත පවරා දීමට හැකි බව ගරු උප සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල මුදල් අය කර එම කඩ කාමරය ඔහු වෙත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 භූ තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීමේ තෙදින වැඩමුළුව

නායයාම් වලට ලක් වන ප්‍රදේශවල තාක්ෂණික නිලධාරීන් හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන ශ්‍රී ලංකා පදනම මගින් පවත්වනු ලබන භූ තාක්ෂණික දැනුම

ප්‍රවර්ධනය කිරීමේ තෙදින වැඩමුළුවට මෙම සභාවේ වැඩ අධිකාරී යූ. වී. දැල බණ්ඩාර, මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක, කාර්මික නිලධාරී එස්. එච්. කුමාර කරුණාරත්න යන මහත්වරුන් රු. 12,000.00 බැගින් ගෙවා සහභාගී කරවීමට ගරු උප සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

**06:03 බස්නැවතුම්පොල බී - 17 කඩ කාමරය ලබා ගැනීම - එම්. ඒ. අතුල කරුණාරත්න මයා**

බස්නැවතුම්පොල බී - 17 කඩ කාමරය දැනට මාස කිහිපයක සිට වසා දමා ඇති බැවින් එම කඩ කාමරය මාසික කුලී පදනම මත පවරා දෙන මෙන් එම්. ඒ. අතුල කරුණාරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, මෙම කඩකාමරය දැනට මුද්‍රා තබා ඇති බවත්, එයට 2013 ජනවාරි මාසයේ සිට මුදල් අයවීමට ඇති බවත්, කුලී ගෙවන ලෙස කිහිප වරක්ම දැනුම් දුන්නත් මෙතෙක් එම කුලී ගෙවීමට අදාල අය අපොහොසත් වී ඇති බවත් එතුමන් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලද අතර, අදාල හිඟ කුලී ගෙවීමේ පදනම මත අදාල ඉල්ලීම කර ඇති අය වෙත එම කඩකාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 බස්නැවතුම්පොල ඞී - 17 කඩකාමරය අලුත්වැඩියා කිරීම**

බස් නැවතුම්පොල උඩු මහලේ පිහිටි අංක 17 දරන කඩ කාමරය මෙම වසරේ ජනවාරි මාසයේ සිට වසා දමා ඇති බවත්, කඩකාමරයේ ඉදිරිපස යකඩ දොර කැඩී ඇති බැවින් කිසිවකු එම කඩකාමරය බද්ද පදනම මත ලබා ගැනීමට ද ඉදිරිපත් නොවන බවත්, මෙම කඩකාමරයේ දොර නගර සභාවේ වියදමෙන් සකස් කිරීමට ගරු සභාපතිතුමන් විසින් ද දැනුම් දී ඇති බවත් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල කඩකාමරයේ දොර අලුත් වැඩියා කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 කම්පන මාර්ග තලනය මිල දී ගැනීම සම්බන්ධයෙන් වූ අවසාන ප්‍රසම්පාදන තීරණය ලබා ගැනීම.**

ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව, මාර්ග අලුත්වැඩියා කටයුතු සඳහා තනි පුද්ගලයකුට තනිව හැසිරවිය හැකි කුඩා ප්‍රමාණයේ කම්පන මාර්ග තලනයක් මිල දී ගැනීම සඳහා අවම මිල ගණන් ප්‍රසම්පාදන දැන්වීම් මගින් ඉදිරිපත් කර ඇති කාලය ඇතුලත ඉදිරිපත් කර ඇති ආයතනයෙන් මිල දී ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 2013 - මගනැගුම, ව්‍යාපෘති ඉටුකිරීමේ දී ඇතිවන ගැටළු සාකච්ඡා කිරීම.**

2013 මග නැගුම වැඩසටහන යටතේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යෙන් කරන ලද රු. 100,000.00ක මුදල් ප්‍රතිපාදන යටතේ මාර්ග දෙකක අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට යෝජනා වී ඇති බවත්, එහි දී ලැබී ඇති උපදෙස් අනුව කිසිදු නිර්මිතයක් ඉදිකිරීම නොකළ යුතු වුවත් නිර්මිතයන් යෙදිය යුතු මාර්ගයන් ද යෝජනා අතර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, ඇතැම් මාර්ගයන්හි නියමිත සම්පූර්ණ දුර ගල් ඇතිරීමෙන් පසු මුදල් ඉතිරි වන බව ද සභාවට දක්වන ලදී.

එබැවින් එම කරුණු සලකා බලා, එවන් නිර්මිතයන් කළ යුතු අවස්ථා වල දී වැඩසටහන වෙතින් පූර්ණ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඒවා සිදු කිරීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 බලන්ගොඩ නගර සභාව මගින් ටෙන්ඩර් කරනු ලබන ගව ඝාතකාගාරය සම්බන්ධවයි**

බලන්ගොඩ නගර සභාව මගින් ටෙන්ඩර් කරනු ලබන ගව ඝාතකාගාරය සම්බන්ධව ප්‍රදේශයේ ගෞරවනීය නායක ස්වාමීන් වහන්සේලා සහ ජ්‍යෝෂ්ඨ පුරවැසියන්ගේ අත්සනින් යුතුව මෙම සභාවට ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී. අදාල ලිපියෙන් ද දක්වා ඇති පරිදි පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුදු දිනයේ උදෑසන ඉතාමත් කෲර ලෙස ප්‍රවාහනය කළ ගවයින් 11 දෙනෙකු සහිත ලොරියක් පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බව ද, දින කිහිපයක් ඇතුලත එම ලොරියේ සිටි එළදෙනුන් දෙදෙනෙකු පැටවුන් ප්‍රසූත කළ බව ද එතුමන් සඳහන් කරන ලදී. එමෙන්ම 2013 අගෝස්තු මස 17 වන දින උදෑසන 05.00ට පමණ කල්තොට සිට බලන්ගොඩ දෙසට ප්‍රවාහනය කරන හොර හරක් සහිත ලොරියකින් බෝවත්ත ප්‍රදේශයේ දී ගවයින් දෙදෙනෙකු ඉවතට විසිවී ඇති අතර, අත්පා බැඳ, ලණුවකින් ලොරියට සම්බන්ධ කර තිබූ එම සතුන් බෝවත්ත ප්‍රදේශයේ සිට කිරිමැටිතැන්න ප්‍රදේශයට කිලෝමීටර 12ක පමණ දුරක් මාර්ගය දිගේ ඇදගෙන පැමිණීමෙන් ශරීර කොටස් ද ගැලවී මරුමුවට පත් වී ඇති බවත් එතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.

සභාවකින් ගව ඝාතනාගාරයක් පවත්වාගෙන යා යුතු බව ද, ඒ සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති නමුත් ගවයන් ඝාතනයට පෙර අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් ඇති බව ද, ඝාතනය පිණිස ගෙන එනු ලබන ගවයන් අවුරුදු 12ට වැඩි විය යුතු බව ද, නීරෝගී විය යුතු බව ද, සොරෙන් ගෙනැවිත් නොකැපිය යුතු බව ද, ඝාතනයට දින තුනකට පෙර සිට ප්‍රදර්ශනය කළ යුතු බව ද ආදී වශයෙන් අදාල සීමාවන් දැක්වෙන්නේ වුව ද, ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදක්වමින් ගවඝාතනයන් සිදුවන බව ගරු උප සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී.

නීති විරෝධි ලෙස ගවයන් ගෙන යාමක් පිළිබඳව 119 පොලිස් හදිසි ඇමතුම් ඒකකයට පැමිණිලි කළ විට, පොලිසියෙන් ගව ඝාතකයන්ට ඒ පිළිබඳ දැනුම් දීම වැනි හේතු නිසා ඉහත සඳහන් ඛේදනීය සිද්ධිය ඇති වූ බව ද, මේ ආකාරයට කටයුතු සිදු වීමෙන් නීති විරෝධී ගව ඝාතන වැලැක්වීමට අපහසු තත්ත්වයක් ඇති බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ලබන වසරේ ගව ඝාතනාගාරය සඳහා අනුමැතිය නොදීමට කටයුතු කරන මෙන් සියළු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින බව ද සඳහන් කරන ලදී.

මේ ආකාරයට සිදුවන ගව ඝාතනය නැවැත්වීමට ගෞරවනීය ස්වාමීන් වහන්සේලා සහ සමාජ සංවිධානයන් සමග එක්ව උපරිම ක්‍රියාමාර්ගයන් ගැනීමට බලාපොරොත්තු වන බව ද ගරු උප සභාපතිතුමන් දක්වන ලද අතර, විශේෂයෙන්ම අදාල නීතීන්ට අනුකූලව ගව ඝාතනය කරන්නේ නම් එය සිදුවිය යුතු බව ද අවධාරණය කරන ලදී.

එමෙන්ම මේ සම්බන්ධව අදහස් දැක්වීමට එතුමන් විසින් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට ආරාධනය කරන ලදී

ඒ අනුව,

***ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර*** *මැතිතුමන් මේ සම්බන්ධව අදහස් දක්වමින්, බලන්ගොඩ නගරය ඓතිහාසික පුරවරයක් බව ද නගරයේ වැඩි ප්‍රතිශතය බෞද්ධයන් බව ද ප්‍රකාශ කරන ලදී. සිදුවන හිංසන ක්‍රියා ප්‍රතික්ෂේප කළ යුතු බවත්, නිසි පරිදි නීත්‍යානුකූලව කටයුතු සිදු වන්නේ නම්, ගවයන් මේ*

*ආකාරයට ලොරිවලින් ඇදගෙන යාමක් සිදු නොවන බවත් එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.*

*කලක සිට නගරයේ මෙන්ම සභාව තුළ ද මේ සම්බන්ධව රැල්ලක් ඇති වුව ද, මෙතෙක් ඒ සම්බන්ධව වගකිව යුතු අංශයන් වෙතින් නිසි අවදානයක් යොමු නොවූ බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. කිසිදු ආගමිකයකුට උහුලන්නට බැරි තරම් සත්ත්ව හිංසන සිදුවන මෙවන් කාලයක මෙම ලිපිය ඉතාමත් උචිත බවත් එතුමන් සඳහන් කළ අතර, ගව මස් අත්‍යවශ්‍යම නම් පිට ප්‍රදේශවලින් ගෙනැවිත් විකිණීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බව ද, ගව ඝාතන කටයුතු නිසි පරිදි නීත්‍යානුකූලව සිදුවිය යුතු බව ද දක්වන ලදී.*

***ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන්** අදහස් දක්වමින්, තමන් මෙම සභාවට තේරී පත් වූ කාලයේ සිටම ගව ඝාතනයට විරුද්ධ බවත්, වසර කිහිපයක් තිස්සේ ගව ඝාතන ටෙන්ඩරයට අත්සන් නොකළ බවත ප්‍රකාශ කරන ලදී. අනෙක් ජනතාවගේ අයිතිවාසිකමක් වශයෙන් එය පවත්වාගෙන යාම කළ යුතු නම් අදාල කටයුතු සියල්ල නීත්‍යානුකූලව නගර සභාව විසින්ම සිදු විය යුතු බව ද එතුමන් සඳහන් කරන ලදී. මේ කටයුතු නගර සභාවට වගකිව හැකි ස්ථානයක පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය බව සඳහන් කරන ලදී. එමෙන්ම නගර සභාවෙන් ගව ඝාතනාගාරයක් සාදා නීත්‍යානුකූල වන පරිදි වඩා සෞඛ්‍යාරක්ෂිතව එම කටයුතු සිදු කිරීමට යෝජනා කරන බව ද එතුමන් විසින් වැඩි දුරටත් සඳහන් කළ අතර, එසේ වුවත් තමන් පෞද්ගලිකව ගව ඝාතනයට විරුද්ධ බව ද අවධාරණය කරන ලදී.*

**06:08 බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට ඡන්ද අයිතිය හිමි, නගර සභා බල ප්‍රදේශයේ පදිංචිව සිටින නිවාස හිමියන් හට නගර සභාවට ඡන්ද අයිතිය ලබා දීම**

ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකොට බලන්ගොඩ ප්‍රාදේශීය සභාවට ඡන්ද අයිතිය හිමි, නගර සභා බල ප්‍රදේශයේ පදිංචිව සිටින නිවාස හිමියන් හට නගර සභාවට ඡන්ද අයිතිය ලබා දීම වැඩබලන ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 2013 වර්ෂය සඳහා පුස්තකාල පොත් මිල දී ගැනීම.**

නගර සභා මහජන පුස්තකාලයට 2013 වර්ෂය වෙනුවෙන් මිල දී ගත යුතු පොත් ලැයිස්තුවක් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, අදාල පොත් මිල දී ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බලන්ගොඩ නගරයේ රථවාහන තදබදය අවම කිරීමට නව යෝජනා ඉදිරිපත් කිරීම**

බලන්ගොඩ නගරයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා බලන්ගොඩ පොලිස් ස්ථානාධිපති විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලියක් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මේ සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, පොලීසිය හා අදාල වෙනත් අංශයන් එක්ව සාකච්ඡා කර තීරණයක් ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 බලන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්, බලන්ගොඩ නගර සභාවට අයත් ඉඩම් සමග හුවමාරුව - අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ), නාගරික සංවර්ධන අධිකාරිය.**

බලන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්, බලන්ගොඩ නගර සභාවට අයත් ඉඩම් සමග හුවමාරුව සම්බන්දව නාගරික සංවර්ධන අධිකාරියේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කර ඇති ලිපිය ගරු වැඩබලන සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කළ අතර, ගරු සභාපතිතුමන් පැමිණි පසු ඒ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 ආපදා කළමනාකරණ වැඩසටහන සඳහා තාක්ෂණික හා මූල්‍යමය සහය ලබා ගැනීම**

දැනට බලන්ගොඩ නගර සභාව තුළ ක්‍රියාත්මක වන ආපදා කළමානාකරණ හා දේශගුණික විපර්යාස අවම කිරීමේ තුන් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා UN Habitat - නයිරෝබි හි මග පෙන්වීම මත Rockitellir Foundation ආයතනය එකග වී ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී. එමෙන්ම ඉහත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ඉල්ලුම් පත්‍රයක් යැවීමට ද, මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට මූලික නිර්ණායකය බල ප්‍රදේශයේ ජනගහනය 50,000ට වැඩි වීම වන හෙයින් ඒ සඳහා නගර සභා බල ප්‍රදේශය අවට ඇති බලන්ගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවන්ට අයත් ග්‍රාම නිලධාරී වසම් ද ඇතුලත් කිරීමට ද යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 මාර්ගයේ ඇති විදුලි කණු දෙකක් ඉවත් කිරීම සඳහා - එස්. කදිරවේල් මහතා**

බලන්ගොඩ, කිරිඳිගල, වැලිහරණාව පාර, අංක 21/16 යන ස්ථානයේ පදිංචි එස්. කදිරවේල් යන අයගේ නිවස අසල ඇති විදුලි කණු දෙක ඉවත් කර දෙන මෙන් මෙම සභාවෙන් ඉල්ලා ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල ඉල්ලීම විදුලි බල මණ්ඩලය වෙත දන්වා යැවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 අසනීප තත්ත්වය හේතුවෙන් මහා සභා රැස්වීමට සහභාගී නොවීම - ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

අසනීප තත්ත්වය හේතුවෙන් මෙවර මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් එවන ලද ලිපිය ගරු වැඩ බලන සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීමට ඉදිරිපත් කරන ලද අතර එම නිවාඩුව අනුමත කිරීමට මහා සභාව තීරණය කරන ලදී.

**06:15 කාර්ය මණ්ඩල නිල ඇඳුම් පිළිබඳව මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම**

කාර්යාලයීය නිල ඇඳුම වශයෙන් කාකි කලිනස සහ කාකි කබාය ඇඳීම වෙනුවට කාකි කලිසම හා සුදු කමිසය ඇඳීම සඳහා ඩබ්. ඒ. සේනක, යූ. ආර්. පියදාස, ඩී. එම්. කේ. ටී. අංජු, ඒ. කේ. අමිල ප්‍රසාද් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එසේ වුවත් අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බැවින්, කාකි කලිසම හා කාකි කබාය නිල ඇඳුම් වශයෙන් ඇඳීම කළ යුතු බවට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරකන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 කාර්යාලයීය නාම පුවරුව ස්ථාපිත කිරීම**

මෙම සභාව හඳුනා ගැනීම සඳහා ස්ථිර නාම පුවරුවක් නොමැති බැවින් අදාල ස්ථානීය පරීක්ෂාවන් සිදු කර ලබා දී ඇති නිර්දේශ අනුව, මහජන පුස්තකාලයට යාබදව, දැනට ට්‍රැක්ටර් රථ ඇතුළු කිරීමට ඇති ගේට්ටුවට වම් පසින්, හිස් බිම් කොටසෙහි අදාල නාම පුවරුව සවි කිරීමටත්, එම පුවරුව කලු ගල් පොයින්ට් බැම්ම බැඳ, ඒ මත සාදන ලද පුවරුව ග්‍රැනයිට් ටයිල් අල්ලා, එහි සුදු යකඩ අකුරු සවි කර, භාෂාත්‍රයෙන් සකස් කිරීමටත්, එහි නගර සභා ලාංඡනය ද ඒ අයුරින්ම සැකසීමටත්, පුවරුව ඉදිරිපිට දර්ශනීය අයුරින් සකස් කිරීමටත්, ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලද අතර, සුදු යකඩ අකුරු සකස් කිරීමට අදාලව ලැබී ඇති මිල ගණන් රු. 149,300.00ක් වන බව ද එතුමන් විසින් දැනුම් දෙන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය .

**06:17 අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබා ගැනීම**

මාර්ගයන්හි ඇතිරීම සඳහා අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ලබා ගැනීමේ දී එය කොන්ත්‍රාත්කරුවන් හරහා ලබා ගැනීමට පෙර තිරණය කර ඇතත්, ඒ සම්බන්ධව මහා සභාවේ මැදිහත් වීම අත්‍යවශ්‍ය බැවින්, මෙම සභාවට අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් ණය පදනම මත සැපයීමට එකඟතාව පළ කර ඇති ආයතනයන් වෙතින් ලද මිල ගණන් අතුරින්, එකක් රු. 39.00 බැගින් ලබා දීමට එකඟ වී කොහුවල, සුනේත්‍රාදේවී මාවත, අංක 46 යන ස්ථානයේ සේනක සිමෙන්ති ප්‍රඩක්ට්ස් පුද්ගලික සමාගම වෙතින් ලබා ගැනීමටත්, එම මාර්ග වලට අදාල මුදල් සභාව වෙත ලද පසු, අදාල සමිති වලට ගෙවීම් කිරීමේ දී එම මුදලින් කොන්ක්‍රීට් කුට්ටි වලට ගෙවිය යුතු මුදල් අඩු කර ගෙවීමටත් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 බස් නැවතුම්පොල ඩී - 12 කඩ කාමරයේ වීදුරු දොරට අමතරව යකඩ දොරක් සවි කිරීම**

බස් නැවතුම්පොල ඩී - 12 කඩ කාමරය නිමල් ගුණරත්න යන අය විසින් බදු පදනම මත ලබාගෙන ඇති බවත්, එහි ආරක්ෂාවට ඉදිරිපස වීදුරු දොරට අමතරව යකඩ දොරක් සවි කිරීමට ඔහු විසින් අවසර ඉල්ලා ඇති බවත් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඔහුගේ වියදමින් එම දොර සවි කිරීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික සම්මත විය.

**06:19 ප්‍රජා විශෝධන ඒකකයේ පුනරුත්ථාපනය වන්නන් සඳහා සංගීතමය සහ චර්යාත්මක ප්‍රතිකාර වැඩසටහන - ආයුර්වේද වෛද්‍ය නිලධාරී**

බළන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ, ප්‍රජා විශෝධන ඒකකය මගින් ප්‍රජා සේවයට යොදවා ඇති පුනරුත්ථාපනය වන්නන් හට සංගීතමය සහ චර්යාත්මක ප්‍රතිකාර සහ අවශ්‍ය සායනික ප්‍රතිකාර ලබා දී යහපත් පුරවැසියන් වශයෙන් සමාජගත කිරීමේ වැඩසටහනක් පසුගිය මාස 06ක පමණ කාලය ඇතුළත මෙම සභාවේ නිදහස් ආයුර්වේද වෛද්‍ය සායනය මගින් සිදු කර ඇති බව ද, එම වැඩසටහන සඳහා සංගීත

අධ්‍යක්ෂකවරුන්, සංගීත ආචාර්යවරුන් සහ නාට්‍ය හා රංග කලා ආචාර්යවරුන් ඇතුළු සම්පත් දායකයන් ස්වේච්ඡාවෙන් සහභාගී වන බව ද, ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එහි මීළඟ වැඩසටහන 2013.08.30 වන දින තුඹගොඩ, සුදර්ශන මහා විහාරයේ දී පැවැත්වෙන බැවින් ඒ සඳහා සහභාගී වන 25 දෙනෙකුට උදය සහ සවස තේ සමඟ දිවා ආහාරය ලබා දීම සඳහා රු. 3,545.00ක ඇස්තමේන්තුව මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ  මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 බස් නැවතුම්පොල කඩකාමර සතු වාහන හිමියන්ගේ විස්තර - රථවාහන ගාස්තු අය කිරීමට**

බස්නැවතුම්පොල කඩකාමර හිමියන් සතු වාහන පිළිබඳ විස්තරයක් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම රථවාහන නැවැත්වීම වෙනුවෙන් ඒවායින් ගාස්තු අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 බලගහමුල සේනක පෙදෙසට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

බලගහමුල සේනක පෙදෙසට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 500,000.00ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:02 මුගුණමලේ බණ්ඩාරවත්ත මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

මුගුණමලේ බණ්ඩාරවත්ත මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 500,000ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:03 බාන්ස් රත්වත්ත මාවතේ රත්නායක සර්ලගේ නිවසට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

බාන්ස් රත්වත්ත මාවතේ රත්නායක සර්ලගේ නිවසට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 500,000ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:04 අනඳමෙත්ගම ශෛලතලාරාම මාර්ගයේ දෙවන පටුමග අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

අනඳමෙත්ගම ශෛලතලාරාම මාර්ගයේ දෙවන පටුමග අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 500,000ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:05 බලන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල අසළ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

බලන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල අසළ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 233,476.62ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:06 ඉත්තෑගල හේන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම**

ඉත්තෑගල හේන මාර්ගය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වන රු. 622,209.34ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:06 බලන්ගොඩ තානායමෙහි නානකාමර ටයිල් ඇතිරීම**

බලන්ගොඩ තානායමෙහි නානකාමර ටයිල් ඇතිරීම සඳහා වන රු. 90,770.18ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

**09:01 කෝපිවත්ත මාර්ගය ගල් අතුරා තාර යොදා නඩත්තු කිරීම**

ඉහත ලංසුව සලකා බැලීමට මහා සභාව ප්‍රසම්පාදන මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම සඳහා ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව මහා සභාව විසින් සම්මත කරන ලදී.

ඉදිරිපත් කර ඇති ලංසු අතරින් ඇස්තමේන්තු වැඩ වටිනාකම රු. 1,460,615.41 කට වඩා අඩුවෙන් ටෙන්ඩරය ඉදිරිපත් කර ඇත්තේ තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වන අතර, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය ඇස්තමේන්තු මුදලට වඩා වැඩියෙන් මුදලකට ටෙන්ඩරය ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, ඇප තැන්පත් ආදිය ද නියමිත පරිදි තබා ඇති බැවින්, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ ගණිතමය නිවැරදිතාවය කාර්මික කමිටුව පරීක්ෂාකර බලා වෙනසක් නොවේ නම් රු. 1,454,465.33ක මුදලට කෝපිවත්ත මාර්ගය ගල් අතුරා තාර යොදා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වෙත පිරිනැමීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:01 බලන්ගොඩ තානායමේ අතිරේක හා ඉතිරි වැඩකොටස් සඳහා තීන්ත ආලේපය කිරීමේ කර්මාන්තයේ වැඩකුළිය සඳහා කැඳවන ලද මිල ගණන් සලකා බැලීම**

බලන්ගොඩ තානායමේ අතිරේක හා ඉතිරි වැඩකොටස් සඳහා තීන්ත ආලේපය කිරීමේ කර්මාන්තයේ වැඩකුළිය සඳහා කැඳවන ලද මිල ගණන් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| වැඩ විස්තරය | එල්. අනුර ශාන්ත, මුගුණමලේ, පොල්වත්ත, බලන්ගොඩ | බී. ජී. ටක්ෂිල කීර්ති කුමාර, මහවලතැන්න, අගලකුඹුර, බලන්ගොඩ | එල්. කේ. සුනිල් ජයරත්න, පහළ මස්සැන්න, බලන්ගොඩ. | පී. ජී. ආර්. චමින්ද ජානක, ශෛලතලාරාම මාවත, මෙගොඩ කිරිඳිගල, බලන්ගොඩ. |
|---|---|---|---|---|
| 01. ගෙබිම තීන්ත ආලේපය, වර්ග අඩියක් සඳහා රු. | 4.50 | 6.50 | 10.50 | 8.00 |
| 02. ගෙබිම වැක්ස් ආලේපය රු. | 2.50 | 5.00 | 6.00 | 6.00 |
| 03. එනැමල් තීන්ත ආලේපය රු. | 6.00 | 8.00 | 8.50 | 8.00 |
| 04. පිටත බිත්ති දෙවරක් තීන්ත ආලේපය වර්ග අඩියක් සඳහා රු. | 8.25 | 10.00 | 11.00 | 12.00 |
| 05. පිටත ගල්බිත්ති සීලර් ආලේපය වර්ග අඩියක් සඳහා රු. | 6.00 | 9.00 | 10.00 | 8.00 |

ඒ අනුව, අවම මිල ගණන් ඇතුලත් කර ඇති බලන්ගොඩ, පොල්වත්ත, මුගුණමලේ, එල්. අනුර ශාන්ත යන අයගේ මිල ගණන් පිළිගැනීමටත්, අදාල සේවාව ඔහු වෙතින් ඉටු කර ගැනීමටත් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

**10:01 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් සභාව අමතමින්, පසුගිය මාස කිහිපයක සිට තම යෝජනාවක් වශයෙන් සභාවාරයන්හි දී ඉදිරිපත් කරන ලද, ජේ. එෆ්. ආයතනය වෙතින් රජයට අයවිය යුතු මුදල් සම්බන්ධව මෙතෙක් අදාල අංශයන් වෙතින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව සඳහන් කළේය. රුපියල් ලක්ෂ ගණනාවක අය විය යුතු මුදල් අය නොකර ගනිමින් ඊට වඩා අඩු ප්‍රමාණයේ මුදල් අය කර ගත යුත්තන් සම්බන්ධයෙන් සැලකිලිමත් වීම නුසුදුසු බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය. කාරණය මෙසේ වන හෙයින් නිලධාරීන් හා බලධාරීන් වෙනත් ක්‍රමයකට මේ අය කර ගැනීම් සිදු කරතැයි සැකයක් මතු වීමට හැකි බව ද, මේ ආකාරයට මෙවන් කරුණු

නොසලකා හරින්නේ නම් මහජන නියෝජිතයන් වශයෙන් මෙසේ කටයුතු කිරීමේ ඵලක් නොමැති බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

මෙහි සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම තමන්ගේ සහෝදරයන් වශයෙන් පිළිගන්නා බව ද, ඒ ආකාරයටම තමන් සම්බන්ධයෙන් ද එසේ සලකනු ඇතැයි විශ්වාස කරන බව ද සඳහන් කළ චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් අනතුරුව ප්‍රකාශ කළේ, මේ හේතුවෙන් තමන්ට කිහිප වතාවක්ම මරණ තර්ජනයන් පවා එල්ල වූ බවයි. දිවා රෑ නොබලා මහජන කටයුතු වලට සහභාගී වන අතරතුර ජීවිතයට හානියක් වූවහොත් ඒ සම්බන්ධයෙන් වගකියන්නේ කවුරුන් දැයි එතුමන් ප්‍රශ්න කරන ලදී.

*මේ සම්බන්ධව පිළිතුරු දෙමින් **ගරු වැඩබලන සභාපතිතුමන්** ප්‍රකාශ කළේ, සභාවේ මූලාසනය දරන මේ අවස්ථාවේ තමන් වඩාත් වගකීම් සහිතව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාල කරුණු සපයා දීම තව වගකීමක් වන බවය. එබැවින්, මේ සම්බන්ධව සොයා බලන මෙන් මෙම සභාවේ ආදායම් පරීක්ෂක, වැඩ අධිකාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරී මහත්වරුන් වෙත පසුගිය සතියේ තමන් විසින් දැනුම් දුන් බව ද එතුමන් සඳහන් කරන ලදී.*

*පසුගිය දිනෙක තමන් එම ආයතනයට අදාල ආපන ශාලාවක් විවෘත කිරීමේ උත්සවයකට ආරාධනයක් මත සහභාගී වූ බව ගරු උප සභාපතිතුමන් විසින් දක්වන ලද අතර, එම ස්ථානය ද නීත්‍යානුකූල නොවන බව එතුමන් සඳහන් කරන ලදී. එම ස්ථානය සම්බන්ධයෙන් මෙන්ම තවත් ස්ථානයක කලු අක්කා නමින් හඳුන්වන තැනැත්තියක් ආරම්භ කර ඇති ආපන ශාලාවක් සම්බන්ධයෙන් ද, තම නිවස ඉදිරිපිටම ගාල්ල ප්‍රදේශයේ සිට පැමිණි තැනැත්තකු විසින් සිදු කරන ඉදිකිරීමක් සම්බන්ධව නිවේදනයක් යැවීමට ද තමන් අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇති බව එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.*

*මෙම සභාවේ ඕනෑම ගරු මන්ත්‍රීවරයකු විසින් සිදුකරන ඉල්ලීම් සම්බන්ධව ඉතා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට තමන් ක්‍රියාකරන බව එතුමන් සඳහන් කරන ලද අතර, ගරු සභාපතිතුමන් නොමැති අවස්ථාවේ දී එම අඩුව නොදැනීමට වඩාත් හොඳින් අදාල රාජකාරීන් ආවරණය කිරීම කටයුතු කළ බව ද එතුමන් සඳහන් කරන ලදී.*

## 11. යෝජනා

### 11:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් මහා සභාවට යොමු කරන ලද පහත යෝජනාවන් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.

11:01:01 මිරිස්වත්ත අලාබ්දීන් මාවත පහළ කොටස සම්පූර්ණයෙන් අබලන් වී ඇත.

11:01:02 බෙතල්හිල් මාවත උඩ කොටස කඩා වැටී ඇති පස් ඉවත් කර දීම

11:01:03 උඩකන්ද පාර උඩ කොටස (නගර සීමාව තුළ) වීදි ලාම්පු 03

ඉහත 11:01:01 හා 11:01:01 යෝජනාවන් සම්බන්ධව පරීක්ෂාකර බැලීමෙන් පසුව තීරණයක් ගැනීමටත්, 11:01:03 වන යෝජනාව සම්බන්ධව ගරු සභාපතිතුමන් පැමිණි පසු තීරණය කිරීමටත් උප සභාපතිතුමන් විසින් දන්වන ලදී.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 ජුලි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය

- 2013 ජුලි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 8,334,886.81 |
| වෙනත් ලැබීම් | 10,823,462.31 |
| **මුළු ලැබීම්** | **5,383,581.54** |
| පුනරාවර්තන වියදම් | 5,073,651.44 |
| වෙනත් වියදම් | 1,055,825.60 |
| **මුළු වියදම්** | **6,129,477.04** |

- බළන්ගොඩ තානායමේ 2013.07.31 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.07.01 සිට 2013.07.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන්**

2013.07.01 සිට 2013.07.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 255,169.30 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

## 14. වෙනත් කරුණු:

**14:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමන් මහා සභාව අමතමින්, පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට රුපියල් ලක්ෂ හැටක් වටිනා මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බව ද, මේ සඳහා අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි සපයා ගැනීම ගැටලුවක්ව පැවති බැවින් ඒ පිළිබඳව ගරු වැඩබලන සභාපතිතුමන්ට දැනුම් දුන් පසු අදාල නිලධාරීන්ගේ ද උපදෙස් ලබාගනිමින් ක්ෂණිකව කටයුතු කර, ඒ සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කළ බව ද සඳහන් කරන ලදී. නාගරික මන්ත්‍රීවරුන් වශයෙන් තමන් වෙත ජනතාව තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීමට හැකියාවක් මේ හේතුවෙන් ලැබුණු බව ද එතුමන් සඳහන් කළේය.

සුබයිර් අලීම් මාවත ප්‍රදේශයේ ජනතාවට පාර වතුරෙන් පිරීම නිසා මුහුණ දීමට සිදුවූ අපහසුතාවය මඟ හැරීම සඳහා ගරු අමාත්‍ය ෆයසර් මුස්තෆා මැතිතුමන් විසින් ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමන් සමඟ සාකච්ඡා කර ලක්ෂ 10ක මුදල් ප්‍රතිපාදන තමන් වෙත ලබා දුන් බව ද, ඒ සම්බන්ධයෙන් සහයෝගය දැක්වූ ගරු සභාපතිතුමා, ගරු වැඩබලන සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පළ කරන බව ද එතුමන් විසින් සඳහන් කරන ලදී.

එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතනයන් විසින් සිදු කරන මාර්ග නඩත්තු කිරීම් වල දී කාණු මාර්ග අවහිරවීම් සිදුවන බව ද, මේ හේතුවෙන් පසුගිය දිනයන්හි අලාබ්දීන් මාවතේ ජනතාවට අපහසුතාවයන්ට ලක් වීමට සිදුවූ බව ද, මේ සම්බන්ධයෙන් පරිසර පොලිසිය ද දැනුවත් කළ බව ද, එම ස්ථානයන්හි රෝග බෝවීමේ අවදානමක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් එම ආයතනයන් වෙත දැනුම් දීමට ක්‍රියා කළ යුතු බව ද එතුමන් සඳහන් කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ පැවති රැස්වීමේ දී ගරු වැඩබලන සභාපතිතුමන්, සභාපතිතුමන් නොමැති අවස්ථාවේ දී එතුමන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි අනෙකුත් පළාත් පාලන ආයතනයන්හි නියෝජිතයන්ට ද ආදර්ශයක් වන පරිදි කටයුතු කිරීම සම්බන්ධව සතුට පළ කරන බව ද, ඒ සම්බන්ධව පසුගිය දිනෙක තමන් සහභාගී වූ මංගල උත්සවයක දී හමු වූ දේශපාලඥයන් විසින් ප්‍රශංසාවට ලක් කළ බව ද සඳහන් කරන ලදී.

**14:01 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් මහා සභාව අමතමින්, ගරු සභාපතිතුමන් දිවයිනේ නොසිටින අවස්ථාවේ දී ගරු වැඩබලන සභාපතිතුමන් විසින් නගර සභාවේ ප්‍රතිරූපය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම සම්බන්ධව සතුටට පත් වන බව ද, ගරු මන්ත්‍රීතුමන්ලා පත් කරනු ලබන්නේ ජනතාව විසින් වන බැවින්, සාමූහික බව ඉස්මතු කිරීම වැදගත් බව ද සඳහන් කළේය.

එමෙන්ම, බළන්ගොඩ නව ළමා උද්‍යානය ඉදිකිරීමේ කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා සහයෝගය දැක්වීමට ද, හොඳ ප්‍රමිතියකට අනුව ආකර්ෂනීය අයුරින් එහි කටයුතු නිම කිරීම වැදගත්වන බැවින් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන මෙන් ද එතුමන් විසින් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙදින රාත්‍රී ගරු සභාපතිතුමන් දිවයිනට පැමිණෙන බව සඳහන් කළ ගරු මන්ත්‍රීතුමක්, එතුමන් නොමැති අවස්ථාවේ ගරු වැඩබලන සභාපතිතුමන් අදාල කටයුතු හොඳින් සොයා බලා සිදු කළ බව ද, සේනක පෙදෙස විදුලි පහන් සවි කිරීමට ක්‍රියා කළ බව ද එතුමන් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

අක්කර 18 මාර්ගය පූර්ව මිශ්‍රණය යොදා අළුත්වැඩියා කිරීමට ද එතුමන් විසින් යෝජනා කරන ලදී.

**14:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් මහා සභාව අමතමින්, බළන්ගොඩ නගරයේ රථවාහන තදබදය සම්බන්ධව අදාල අංශයන් සමඟ සාකච්ඡා කර ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී. විශේෂයෙන් බළන්ගොඩ පොලිස් ස්ථානය ඉදිරිපිට බස් නැවතීම සහ ත්‍රී රෝද රථ නතර කිරීම හේතුවෙන් දැඩි වාහන තදබදයක් ඇතිව තිබෙන බවත්, එම ස්ථානයේ ත්‍රී රෝද රථ නතර කිරීම නුසුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙන්ම, එතුමන් නොමැති අවස්ථාවේ රාජකාරී කටයුතු ආවරණය කරමින්, ගරු වැඩබලන සභාපතිතුමන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් ඉටු කළ බව එතුමන් සඳහන් කරන ලදී. තමන් විසින් මෙදින යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලද බෙතල්හිල් මාවත මෙම නගර සීමාවට අයත් එකක් බවට නීත්‍යානුකූලව සාධක ඉදිරිපත් කළ හැකි බව ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමා එම යෝජනාව ඉටු කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන මෙන් ඉල්ලා සිටියේය.

අද ලංකාවේ මාධ්‍ය නිදහස ඉතාමත් ඛේදනීය තත්ත්වයක පවතින බවත්, මාධ්‍යවේදීන්ට ලිවීමේ නිදහස අහිමිව ඇති බවත්, සිරස, ස්වර්ණවාහිනී, ස්වාධීන රූපවාහිනී වැනි රූපවාහිනී නාලිකාවන් ආණ්ඩුව ආරක්ෂා කිරීමට කටයුතු කරන බවත්, විපක්ෂයට එම මාධ්‍යයන්හි අවකාශය වෙන් නොවන බවත් එතුමන් සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ රූ අග්‍රාමාත්‍ය ධූරයට දෙවරක් තේරී පත් වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දිගින් දිගටම ව්‍යාජ චෝදනා සහිතව මඩ ගැසීමට මාධ්‍යයන් කටයුතු කරන බව ද, එසේ කිරීමට ආණ්ඩුව ක්‍රියාකරන්නේ එතුමන්ගේ ශක්තිය දන්නා බැවින් බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමන්, මෙසේ තනි පුද්ගලයකුට දිගින් දිගටම මඩ ගැසීම සිදුකරන්නේ කවර හේතුවකින් දැයි ප්‍රශ්න කළේය.ආණ්ඩුවක සාර්ථක ක්‍රියාකාරීත්වයක් පැවතීම සඳහා විපක්ෂය ද ශක්තිමත්ව පැවතිය යුතු බැවින් මාධ්‍යයන්හි ක්‍රියාකාරීත්වයට අදාල ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය ද එතුමන් අවධාරණය කරන ලදී. එමෙන්ම සභාවේ කටයුතු වාර්තා කිරීමට පැමිණෙන

මාධ්‍යවේදීන්ට ගෙවනු ලබන දීමනාව ප්‍රමාණවත් නොවන බව සඳහන් කළ ගරු මන්ත්‍රීතුමන්, එම දීමනාව වැඩි කිරීමට පියවර ගන්නා මෙන් ඉල්ලා සිටියේය.

**14:01 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා:**

ගරු වැඩබලන සභාපතිතුමන් පසුගිය මාස එකහමාරක පමණ කාලය තුළ ඉතා සෞම්‍ය අයුරින් සහ දැඩි වගකීමක් දරා ගනිමින් මෙම සභාවේ සභාපති ධූරයේ වැඩකටයුතු ආවරණය කළ බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන්, ඒ සම්බන්ධයෙන් එතුමන්ට ස්තුතිවන්ත වන බව ද සඳහන් කළේය.

වර්තමානයේ ලංකාවේ නොයෙකුත් විෂමාචාරයන් පැතිර යන බව ද, විකෘති කාම රැල්ල, මාධ්‍ය මර්ධනය, සොරකම්, මිනීමැරුම් ආදිය ඇතිවී තිබෙන බව ද එතුමන් දක්වන ලදී. ඕනෑම ජඩවැඩක් සිදු කර බේරී සිටීමට හැකි තත්ත්වයක් නිර්මාණය වී ඇති බව ද, මේ නිසා හානියට පත්වන්නේ අපගේම දරුවන් බව ද, රටේ පොදු ජනතාවගේ චින්තන ශක්තිය පෝෂණය නොකර, වෙනත් කිසිදු සංවර්ධනයක් සිදු කිරීමෙන් ඵලක් නොවන බව ද, කොළඹ, හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපොල ආදී සංවර්ධන ව්‍යාපෘතීන් පමණක් ඕනෑවට වඩා උලුප්පා දක්වමින් පෙන්වන බව ද එතුමන් සඳහන් කරන ලදී.

මේ වන විට ළමුන් 37 දෙනෙකු බාල වයස්කාර ගර්භනීන් බවට පත්ව ඇති බව පසුගිය දිනෙක දැන ගැනීමට ලැබුණු බව ද, මෙවන් අභාග්‍යසම්පන්න තත්ත්වයක් අපගේ නගරයේ වර්ධනය නොවීමට නම් ඒ සම්බන්ධව කතිකාවතක් ඇති කළ යුතු බවට ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**14:01 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා:**

පසුගිය මාස එක හමාරක කාලය තුළ ගරු වැඩබලන සභාපතිතුමන් ඉතාමත් සමබරව හා සාර්ථකව මෙම සභාවේ සභාපතිධූරයේ කාර්යයන් ආවරණය කළ බව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සඳහන් කරන ලදී.

එමෙන්ම ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් සඳහන් කළ දෑ සාවද්‍ය බව ද, අද ලංකාවේ ජනමාධ්‍ය නිදහසක් ඇති බව ද, මන්දනා ඉස්මයිල් මහත්මියගේ නිවස කොල්ලකෑම සාමාන්‍ය මංකොල්ලයක් මිස ජනමාධ්‍යවේදිනියකට සිදුවූ බලපෑමක් වශයෙන් නොසැලකිය යුතු බව ද, පොලිසිය වෙතින් එතුමියට එම සිද්ධියේ දී උපරිම ආරක්ෂාව ලබා දීමටත්, අදාල මංකොල්ලකරුවන් අත්අඩංගුවට ගැනීමටත් ක්‍රියා කළ බව ද, එතුමන් අවධාරණය කරන ලදී. වර්තමාන රජයේ පාලන කාලය තුළ එවැනි මාධ්‍ය වේදීන්ට පහර දීම් සිදු නොවූ බව ද, පසුගිය එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ සිදුවූ දේ සියළු දෙනා දන්නා බව ද ගරු මන්ත්‍රීතුමන් වැඩිදුරටත් සඳහන් කළේය.

අතිගරු ජනාධිපතිතුමන් සාමාන්‍ය ජනතාව ඉතාමත් සමීපව ආශ්‍රය කරන, ජනමාධ්‍යයන්ට හිතවත් නායකයකු බව ද එතුමන් ප්‍රකාශ කරන ලද අතර, සිරස නාලිකාව එක්සත් ජාතික පක්ෂයට සහය දක්වන නාලිකාවක් බැවින් එම පක්ෂයට එයින් මඩ ගසනවා යැයි චෝදනා නොකළ යුතු බව ද, ආණ්ඩු පක්ෂයට කිසිදු රූපවාහිනී ඇතුළු මාධ්‍ය ආයතනයක් නොමැති බව එතුමන් සඳහන් කළේය. අද අපරාධ රැල්ලක් ඇති බව පැවසීම ද සාවද්‍ය බව ද, ඇතිවන යම් යම් සිදුවීම් මාධ්‍ය නිදහස හේතුවෙන් නිතර දක්නට ලැබෙනවා පමණක් බව ද ගරු මන්ත්‍රීතුමන් සඳහන් කළේය.

පසුගිය එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ සිදුවූ නොයෙකුත් අපරාධයන් සම්බන්ධව එම පක්ෂයේ කිසිදු දේශපාලඥයකු අත්අඩංගුවට නොගත්තත්, වර්තමානයේ පාලක පක්ෂයට අයත් කවර මට්ටමේ දේශපාලඥයකු හෝ ඉහල නිලධාරියෙකු වුව ද වරදක් සිදු කළහොත් අදාල නීතිමය ක්‍රියාමාර්ගයන් වෙනසක් නොමැතිව සිදු කරන බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී.

සංවර්ධනය පෙන්වන්නේ එසේ දැවැන්ත මහා මාර්ග, ගුවන්තොටුපල, වරායන් ආදිය ඉදිකර ඇති බැවින් යැයි ද ගරු මන්ත්‍රීතුමන් විසින් සඳහන් කරන ලද අතර, එය එසේ

නොවේ නම් ජනතාවට මැතිවරණයන්හි දී ආණ්ඩුව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ද අවස්ථාව ඇති බව ද, පසුගිය මැතිවරණ සියල්ලේම රජයට විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා දීමට ජනතාව ක්‍රියා කළ බව ද සඳහන් කරන ලදී.

## 15. අවසානය

**ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

තමන් මෙම සභාවේ සභාපතිධූරයේ රාජකාරී ආවරණය කරන මේ මොහොතේ සිදුවන සංවාදයන් සම්බන්ධව සතුටට පත් වන බව ගරු වැඩබලන සභාපතිතුමන් සඳහන් කරන ලදී. එමෙන්ම ජනමාධ්‍යයන්ට ඕනෑම දෙයක් සිදු කළ හැකි බව සඳහන් කළ අතර, පසුගිය එක්සත් ජාතික පක්ෂ රජය සමයේ නොයෙක් සිදුවීම් වාර්තා කළ රිචඩ් සොයිසා වැනි ජනමාධ්‍ය වේදීන්ට මුහුණ පෑමට සිදුවූ දෑ සියල්ලන්ගේම මතකයේ ඇති බව ද ප්‍රකාශ කළේය.

ඕනෑම රජයක මෙන්ම මෙම රජයේද ඉතාමත් සුළු පිරිසක් වැරදි කරන අය සිටින බව ද, නියමාකාරව වැඩකරන පිරිසක් ද සිටින බව ගරු උප සභාපතිතුමන් සඳහන් කළේය. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට එරෙහිව වැඩියෙන්ම කටයුතු කරන්නේ එම පක්ෂයේ සාමාජිකයන්ම බව ද, එම පක්ෂයට පේන තෙක්මානයක ජයග්‍රහණයක් නොමැති බව ද සඳහන් කළේය.

මෙම සභාව මෙහෙයවීම සඳහා තමන් තුළ දැඩි කැමැත්තක් තිබූ බව ද, මුල දී යම් චකිතයයක් ඇති වූවත්, පසුගිය මාස එක හමාරක කාලය තුළ එම කාර්යය ඉතාමත් සාර්ථකව සිදු කිරීමට හැකියාව ලැබුණු බව ද, ගරු සභාපතිතුමන් විදෙස්ගතව සිටින කාලය තුළ එතුමන් සමඟ නිරන්තර සන්නිවේදනයක් තබාගනිමින් කටයුතු කළ බව ද සඳහන් කරන ලදී.

එම කාලය තුළ නගර සභාව සුනිල් පේමසිරි ක්‍රිකට් කුසලාන තරගාවලිය ජයග්‍රහණය කළ බව ගරු වැඩබලන සභාපතිතුමන් සිහිපත් කළේය. එමෙන්ම වසරකට වැඩි කාලයක් තුළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් එකතු වී තිබූ බව ද, අදාල මාර්ගයන්ගෙන් 17න් 12ක ප්‍රමාණයක ගොනු නිසි පරිදි සකස් කර, ප්‍රාදේශීය ලේකම් වෙතින් ද සහතික කර, මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දීමට කටයුතු කළ බව ද, ජේ. සී. බී යන්ත්‍රය ද අළුත්වැඩියා කිරීමට හැකි බව ද සඳහන් කළේය. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සමස්ත ලංකා කාර්ය සාධන තරගයේ දී වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ද අලංකාරවත් අයුරින් සකසා ඇති බව ද එතුමන් විසින් සඳහන් කරන ලදී. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් නිතරම විමසන පරිදි තාර ගෙන්වා මාර්ග පද්ධතිය අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද බව ද, වැලිහරණාව මාර්ගය, මහමෙව්නා පාර, චෙට්නෝල් පාර, පුවක්ගහමුල්ල පාර, පල්ලෙවෙල පාර, දුණුමඩලගහවත්ත මාර්ගය, ගමගෙදර පාර, සෙලෝවත්ත, මැදකිරිදිගල පාර ආදී මාර්ගයන් ප්‍රතිසංස්කරණය සහ ශුද්ධ කිරීම් ආදිය සිදු කළ බව ද සඳහන් කළේය.

කිසිදු වෙනත් බලාපොරොත්තුවක් නොමැතිව මේ ආකාරයට හැකි උපරිම අයුරින් ජනතාවගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමට කටයුතු කළ බව ද, කාර්ය මණ්ඩලයට නිල ඇඳුම් ලබා දීම, රු. 25,000.00 ණය මුදල් සඳහා අත්සන් කිරීම ආදිය ද සිදු කළ බව ද, ජේ. එෆ්. ආයතනයට අදාල ලියකියවිලි යැවීම ආදිය සිදු කළ බව ද එතුමන් සඳහන් කළේය. මේ සඳහා නගර සභා නිලධාරීන් වෙතින් සහයෝගය ලැබුණුබව ද එතුමන් සිහිපත් කළේය. උදෑසන 7 වන විට නගර සභාවට පැමිණ එහි කටයුතු අධීක්ෂණය කළ බව ද, රාත්‍රියේ ද පැමිණ විමසා බැලූ බව ද, ගලිබවුසරයෙන් නිසි ආදායම් ලබා ගැනීම සම්බන්ධව සොයා බලා එහි ආදායම වැඩි කරගත්බව ද, කාර්ය සාධන තරගයේ දී ලකුණු ලබා ගැනීම සඳහා අදාල නිර්ණායකයන් සපුරා ගැනීමට ක්‍රියා කළ බව ද එතුමන් තව දුරටත් සඳහන් කරන ලදී.

ගව ඝාතනාගාරය සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයුරින් කටයුතු කිරීමට ඉදිරියේ දී කටයුතු කළ යුතු බව ද, පෞද්ගලික ස්ථානයෙන් එම කටයුත්ත ඉවත් කර දැනට ඇති තත්ත්වය සමනය කිරීම කළ යුතු බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. නිතරම ගරු සභාපතිතුමන්

වෙනුවෙන් සියළු විමසීම් කර අදාල අවශ්‍යතා ඉටු කර දීමට ද තමන් කටයුතු කළ බව ද, එතුමන් පැමිණෙන විට පිළිගැනීමට උත්සවයක් සූදානම් කර ඇති බව ද, ඒ අවස්ථාවට සියළු දෙනාට පැමිණීමට ආරාධනය කරන බව ද දක්වන ලදී.

මෙදින රැස්වීම සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් සියළු දෙනාට ස්තූතිය පළ කරමින් මහා සභා රැස්වීම ප.ව. 12.30ට පමණ ගරු වැඩබලන සභාපතිතුමන් විසින් අවසාන කරන ලදී.

ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න,
වැඩබලන සභාපති,
බළන්ගොඩ නගර සභාව.